විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය தலைமுறையொன்றின் பெருமிதம் Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. : විවැ/දි.ස./ජී.ස./2021

ඔබේ අංකය / உமது இல. / Your No. : ..........................

දිනය / திகதி / Date : 2020/12/03

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**විශ්‍රාමික ජීවිත සහතිකය - 2021**

2021 වර්ෂය සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි විශ්‍රාමික පුරවැසියන්ගෙන් ලබා ගත යුතු විශ්‍රාමික ජීවිත සහතික ආකෘතිය මේ සමඟ ඔබ වෙත එවමි. 2021 වසර සඳහා මෙම ආකෘතිය හැර වෙනත් පරිබාහිර ආකෘති ලබා ගැනීමෙන් වලකින ලෙස කාරුණිකව දන්වමි.

02. විශ්‍රාම වැටුප් ගෙවීමේදී භාරකරුවන් හරහා ගෙවනු ලබන විශ්‍රාම වැටුප් භාරකාර තොරතුරු, අනිවාර්යයෙන්ම මෙම ආකෘතියේ අංක 08 යටතේ සම්පූර්ණ කර ගත යුතු අතර එම ආකෘති පළමුව ඔබ පරිගණක පද්ධතියේ ආදානය කිරීමෙන් අනතුරුව ලේඛනයක් සමඟ නොපමාව අදාල ජීවිත සහතිකය විශ්‍රාමිකයාගේ ගොනුවට ගොනු කල යුතුය.

03. ජීවිත සහතික ලබා ගැනීමේදී පහත සඳහන් අඩුපාඩු සිදුවී ඇති බව විගණනයේදී අනාවරණය වී ඇති අතර එම තත්වය නිවැරදි කර ගැනීමට මෙම අවස්ථාවේ කටයුතු කල යුතුය. එනම්,

I. ජාතික හැඳුනුම්පත් අංකය අනිවාර්යයෙන්ම පරීක්ෂා කර නිවැරදිව ඇතුලත් වී ඇති බවට සහතික විය යුතුය.
II. විශ්‍රාමිකයාගේ අත්සන හා දිනය අනිවාර්යයෙන්ම තිබිය යුතු අතර ග්‍රාම නිලධාරි විසින් නිල මුද්‍රාව තබා සහතික කර තිබිය යුතුය.
III. අදාළ ආකෘතියේ අත්සන වෙනුවට ඇඟිලි සළකුණු තැබීම මඟින් ජීවිත සහතිකය ලබා දීමේදී එයට හේතුව විශේෂ සටහන් ලෙස ග්‍රාම නිලධාරී විසින් ඇතුලත් කර තිබිය යුතුය.
IV. ජීවිත සහතික, පද්ධතිය තුල 2021.03.31 දිනට පෙර යාවත්කාලීන කල යුතුය. ජීවිත සහතිකය යාවත්කාලීන නොවන විශ්‍රාමිකයන්ගේ වැටුප් 2021 මැයි මස වන විට අත්හිටුවන බව දැන්විය යුතුය.

04. තවද ජීවිත සහතික ලබා ගැනීමේදී පූජ්‍ය පක්ෂය සම්බන්ධයෙන් කටයුතු කල යුතු ආකාරය දැක්වෙන අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HAF-2/15 CORDI/1507-(SUB 1) හා 2019.11.06 දිනැති ලිපිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන මෙන්ද වැඩිදුරටත් දන්වමි.

05. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 2/2020 අනුව ඇඟිලි සලකුණ මගින් ජීවිත සහතිකය යාවත්කාලීන කිරීමට කටයුතු කරන විශ්‍රාමිකයන් සඳහා ජීවිත සහතික පෝරම ලබා ගැනීමට අවශ්‍ය නොවේ.

06. 2020 වර්ෂය සඳහා ජීවිත සහතික ඉදිරිපත් නොකළ කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම නතර නොකළ විශ්‍රාමිකයින් පිළිබඳව ඔබ විසින් විශේෂ අවධානය යොමුකර 2021 වර්ෂයේ ජීවිත සහතිකය ලබාගැනීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතුබව ද දන්වමි.

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

07. මේ සම්බන්ධයෙන් ඔබෙන් ලැබෙන සහය ඉතා අගය කොට සලකමි.

ඒ. ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 1) ලේකම්, රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
2) ලේකම්, අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
3) සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

## Districtwise count-gn not certified 2020

| | district | count |
|---|---|---|
| 1 | Colombo | 1578 |
| 2 | Ampara | 94 |
| 3 | Anuradhapura | 96 |
| 4 | Badulla | 35 |
| 5 | Batticaioa | 4 |
| 6 | Galle | 48 |
| 7 | Gampaha | 70 |
| 8 | Hambanthota | 16 |
| 9 | Vavuniya | 19 |
| 10 | Kaluthara | 89 |
| 11 | Kandy | 43 |
| 12 | Kegalle | 24 |
| | Kilinochchi | 6 |
| 14 | Kurunegala | 47 |
| 15 | Mannar | 21 |
| 16 | Matale | 43 |
| 17 | Mathara | 14 |
| 18 | Monaragala | 13 |
| 19 | Mulative | 2 |
| 20 | Nuwara Eliya | 7 |
| 21 | Polonnaruwa | 16 |
| 22 | Puttalam | 30 |
| 23 | Rathnapura | 17 |
| 24 | Trincomali | 2 |
| 25 | Jaffna | 7 |

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

**මෙය නොමිලයේ නිකුත් කරනු ලබන ආකෘතියකි.**

# විශ්‍රාමික පදිංචි සහතිකය - 2021

අනු අංකය (ග්‍රාම නිලධාරී වෙත අංක කිරීම සඳහා) ____

විශ්‍රාම වැටුප් ගෙවීමට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ____

**2021 නව වසර ඔබටත්, පවුලේ සැමටත් සාමය,සතුට හා සෞභාග්‍ය සපිරි සුභ නව වසරක් වේවා !**

**සැ.යු : ඩිජිටල් ජීවිත සහතික ක්‍රමය හරහා විද්‍යුත් ඇඟිලි සලකුණ භාවිතයෙන් ජීවිත සහතික යාවත්කාලීන කරන විශ්‍රාමිකයන් මෙම පෝරමය සම්පූර්ණ කල යුතු නොවේ. ඔවුනට විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 2/2020 අනුව අදාළ පහසුකම සලසා ඇති ඕනෑම ආයතනයක් මඟින් එම සේවාවන් ලබාගත හැක.**

විශ්‍රාම වැටුප් ලබාගන්නා ඔබ වාර්ශිකව ලබාදිය යුතු මෙම සහතිකය සම්පූර්ණ කර ඔබ පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මහතා / මහත්මිය වෙත **2021.03.31** දිනට පෙර ලබා දෙන්න. නැතහොත් **2021 මැයි** මස සිට **විශ්‍රාම වැටුප් ගෙවීම අත් හිටුවීමට** සිදුවන බව කරුණාවෙන් සලකන්න.

1. මුලකුරු සමඟ නම ____
2. ජාතික හැඳුනුම්පත් අංකය (අනිවාර්යවේ) ____
3. උපන් දිනය (වර්ෂය / මාසය / දිනය) ____
4. විශ්‍රාම වැටුප් — වර්ගය ____ අංකය ____
5. පදිංචි ලිපිනය ____
6. දුරකථන අංක - නිවස ____ ජංගම ____

   මාසික වැටුප් ගෙවීම් විස්තර ජංගම දුරකථනයට එවීමට සැලසුම් කර ඇති බැවින් ජංගම දුරකථන අංක ඇතුලත් කිරීම අනිවාර්ය බව සලකන්න.
7. ග්‍රාම නිලධාරී වසම / අංකය ____ / ____
8. භාරකරුවෙකු සිටීනම් - නම ____

   8.1 ඔහු / ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය ____

   8.2 ඔහු / ඇයගේ දුරකථන අංකය - නිවස ____ ජංගම ____

**මා විසින් ඉහත සඳහන් කරන ලද කරුණු සත්‍ය බව ප්‍රකාශ කරමි.**

දිනය.........................................

.................................................
විශ්‍රාම වැටුප් ලාභීයාගේ අත්සන

## ග්‍රාම නිලධාරී වාර්තාව

**නිරීක්ෂණ** ____

ඉහත විශ්‍රාමික ස්වාමීන් වහන්සේ/ පූජකතුමා/ මහතා/ මහත්මිය/ මෙනෙවිය මෙම ග්‍රාම නිලධාරී වසමේ අදාල ලිපිනයෙහි ස්ථිර / තාවකාලික පදිංචිකරුවකු බව සහතික කරමි. උන්වහන්සේ / ඔහු / ඇය තනිව කටයුතු කර ගැනීමට හැකි යහපත් සෞඛ්‍ය තත්වයකින් ඇත / නැත. මෙම නම ඡන්ද හිමි නාම ලේඛනයේ සඳහන්ව ඇත / නැත.

දිනය.............................................

.................................................
ග්‍රාම නිලධාරී අත්සන හා නිල මුද්‍රාව

## අනු අත්සන් කරමි

දිනය....................................

.................................................
ප්‍රාදේශීය ලේකම්/ බලය ලත් නිලධාරී අත්සන හා නිල මුද්‍රාව

මෙම පදිංචි සහතිකය පුරවා ග්‍රා.නි වෙත බාරදුන්නේ කවුරුන්ද යන වග
(අදාල කොටුව තුල(✓)ලකුණ යොදන්න)

| විශ්‍රාමිකයා | | භාරකරු | |
|---|---|---|---|

............................................ **මෙතනින් වෙන් කරන්න** ............................................

**පදිංචි සහතිකය බාරගත් බවට දැනුම් දීම.**

විශ්‍රාම වැටුප් අංකය.........................................

නම ..............................................................................

ලබාදුන් විශ්‍රාමික පදිංචි සහතිකය බාරගත් බව සහතික කරමි.

බාරගත් දිනය.........................................

.................................................
විශ්‍රාම විෂයභාර නිලධාරී/ ග්‍රාම නිලධාරී